


ඔබවහන්සේගේ වචනයද කැමැත්තද ගින්නකි ආශිර්වාදයකි

(ශුද්ධවූ ලූක් 11:28,12:49 ඇසුරෙන්)

*එක් එක්කෙනා අකමැත්තෙන් වත් බලකිරීම නිසා වත් නොව සිය කැමැත්තෙන් තිරණය කරගත් ලෙස දිය යුතු ය. සතුටු සිතෙන් දෙන්නාට දෙවියන් වහන්සේ ප්‍රේම කරන සේක. සියල්ලෙහි දී ඔබ නිතර ම සියලු අයුරින් අනූනව සිටින පිණිසත් සියලු යහපත් සේවාවන්ට නොමසුරුව ආධාර කළ හැකි වන පිණිසත් උවමනා පමණටත් වඩා අධික ලෙස ආශිර්වාද ඔබට දෙන්න දෙවියන් වහන්සේට පුළුවන.*

*(2 කොරෙන්ති 9:7-8)*

අප ආදර අම්මේ, තාත්තේ, දුවේ, පුතේ, සොයුර, සොයුරිය,

**<u>ශ්‍රී ප්‍රශංසාරාම යාච්ඤාංගනයේ වේදිකාව ප්‍රතිසංස්කරණය කිරීම.</u>**

කිතු දන පුබුදුව ගිහි අපෝස්තලික ක්‍රිස්තු දාන සේවාව සිය ස්වර්ණමය ජයන්තිය 2021 වර්ෂයේදී සැමරීමට සුදානම් වෙමින් සිටින බව දැනුම් දෙන්නේ ඉතා සතුටිනි.

අප පුබුදු සංඝයක් ලෙස එක්රැස්ව කළ යාච්ඤා මෙහෙයක් තුළ ලද මගපෙන්වීමක ප්‍රතිඵලයක් වශයෙන්, අපගේ පුබුදු වාර්ෂික මංගල්‍යය වන ශුද්ධාත්ම ආගමන මංගල මහෝත්සවය පවත්වනු ලබන ශ්‍රී ප්‍රශංසාරාම යාච්ඤාංගනයේ වේදිකාව ප්‍රතිසංස්කරණය කළ යුතු බවට ආලෝකයේ වචනයක් ලදිමු.

එම වේදිකාව දැනටම ඉතාමත් අබලන් පිවිසීමට නුසුදුසු තත්ත්වයෙන් පවතින හෙයින් කඩිනමින් පිළිසකර කළ යුතු තත්ත්වයක පවතින මුත් පිළිසකර කරනු වෙනුවට එය බිඳ දමා කලක් පවතින සේ අලුතින්ම වේදිකාව ගොඩනැගීම සුදුසු බව අප හට පෙනී ගොස් ඇත.

කෙසේ වුව ද එසේ ගොඩනැගීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවන හෙයින් මූල්‍ය සහයෝගය පැතීමට අපට සිදුව ඇත. ඒ අනුව විශ්වාසයේ පියවරක් වශයෙන් අපගේ පුබුදු හිතවතුන්ගෙන් සහ අප කිතු දන පුබුදුවේ සුබසාධනය පතන සියලු හිතාදර ඔබගේ නොමසුරු දායකත්වය පතා මෙම ලිපිය ඔබ වෙත එවන්නෙමු.

*ඔබගේ බැතිබර දායකත්වය*

**කිතු දන පුබුදුව නමින් රාගම මහජන බැංකු ශාඛාවේ අංක 316100134565082 දරණ ගිණුම වෙත බැර කළ හැක.**

නැතිනම් මාරි දිසානායක ( දුරකථන: 0718347201 ඊ මේල් marie.ranmali@gmail.com හෝ සුරැඳි ඩොරින් සිල්වා සොහොයුරිය ( දුරකථන: 0771237842 ඊ මේල් office@pubuduwa.org වෙත ඔබගේ පරිත්‍යාග කල බව දැනුම් දෙන්න.

ස්තුතියි

රන්ජනා කවිරත්න
ජාතික දිවැසි එකතුව
කිතු දන පුබුදුව